# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2151/7 - 2019 නොවැම්බර් මස 25 වැනි සඳුදා - 2019.11.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

විධාන අංක 69.

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

10 (1) (අ) වගන්තිය යටතේ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10 (1) (අ) වගන්තිය යටතේ බලතල ප්‍රකාරව ක්‍රියාකරමින් සියලු ඉපිලෙනයක් මගින් ක්‍රියාකරන ජල කපාට (float operated valves) සහ අමතර කොටස් නිෂ්පාදකවරුන්, ආනයනකරුවන්, බෙදාහරින්නන් සහ වෙළෙඳුන් විසින් පහත දක්වා ඇති තොරතුරු ඉපිලෙනයක් මගින් ක්‍රියාකරන ජල කපාට හෝ අමතර කොටස් අඩංගු එක් එක් සහ සෑම ඇසුරුමක පැහැදිලි සහ නොමැකෙන ආකාරයකට සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම මුද්‍රණය කළයුතු බවට මෙයින් විධාන කරනු ලැබේ.

(1) සන්නම් නාමය

(2) නිෂ්පාදිතයේ නම/අමතර කොටසේ නම

(3) නිෂ්පාදකයාගේ නම සහ ලිපිනය, ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය/එකලස් කිරීම කරන ලද්දේ නම් නිෂ්පාදකයාගේ සම්බන්ධිත තොරතුරු

(4) ආනයනකරුගේ නම, ලිපිනය සහ සම්බන්ධිත තොරතුරු

(5) ප්‍රභව රට (කර්මාන්ත ශාලා පිහිටීම)

(6) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කරන ලද ලියාපදිංචි අංකය

(7) කාණ්ඩ හඳුනාගැනීමේ අංකය/කේතය

(8) උපරිම සිල්ලර මිළ

(9) කපාටයේ නාමික ප්‍රමාණය

(10) පීඩන කාණ්ඩය (අඩු/මධ්‍යම/ඉහළ)


1A - PG 004771 — 217 (2019/11)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

(11) ව්‍යුහ මාදිලි අංකය

(12) ඉපිල්ලුම් අමුද්‍රව්‍ය

(13) සවිකිරීම සඳහා උපදෙස්

මෙම විධානය 2020 ජුනි මස 01 වැනි දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

ආචාර්ය ලලිත් එන්. සේනවීර,
සභාපති.

2019 නොවැම්බර් මස 22 වැනි දින,
කෙළඹ දී ය.

12 - 318

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.